# Abstract No 62

## වෛදික මන්ත්‍රයන්ගේ ශුද්ධෝච්චාරණ සිද්ධිය අපේක්ෂිත ශික්ෂා වේදංගය.

**පූජ්‍ය බෝදාවල පියභාරති හිමි**
ආරාධිත දේශක, සංස්කෘත අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
piyabharathi@gmail.com

වෛදික මන්ත්‍රයන්ගේ ශුද්ධෝච්චාරණසිද්ධිය අපේක්ෂිත ව ශික්ෂා වේදාංගය නිපදවා ඇත. වර්ණ, ස්වර, මාත්‍රා, බල, සාම හා සන්තාන යන අවයව යටතේ ඒ පිළිබඳ ව සාකච්ඡා කෙරේ. ඉපැරණි භාරතීය ස්වර විද්‍යාව, ස්වරමාලා ශික්ෂණය, ශබ්දවිද්‍යාව (Phonetics/ Phonology) කේන්ද්‍රීය ව, ඉලක්කගත ව පැවතියේ වෛදික සම්ප්‍රදායය රක්ෂාකර ගැනීමට හා පෝෂණය කිරීම සඳහා යි. පාණිනී, ව්‍යාස, භාරද්වාජ, යාඥවල්ක්‍ය, නාරද හා ආපිශාලී බඳු පඬිවරු මෙම ස්වරමාලා ශාස්ත්‍රය අධ්‍යයනය කොට එහි පැවැත්මට ශික්ෂාග්‍රන්ථ රාශියක් ම රචනා කළහ. මන්ත්‍රයන්හි උච්චාරණ ශුද්ධිය අභිප්‍රේත ව විරචිත එබඳු කෘති හැත්තෑපහකට අධික ය. පඨනය හා පාඨනය මුඛ්‍යතම අභිප්‍රාය වූ මෙකී ස්වරශාස්ත්‍රය තුළ ශබ්ද නිෂ්පාදන ක්‍රියාවලියේ ආරම්භයේ පටන් සජ්ඣායනය දක්වා ස්වර, කාල, ස්ථාන, ප්‍රයත්න, හා අනුප්‍රධාන යන ලක්ෂණයන්ගේ ස්වරූපය හා ආවශ්‍යකභාවය අවධාරිතය හ. එමෙන් ම විවිධ හස්තසංඥාරූපී ස්වර අවධාරණය කිරීම් ද මෙකී මන්ත්‍ර ගායනයේ ප්‍රමුඛතම කාරණයකි. හස්තචාලානුවිධි ඇතැම් ශික්ෂා ග්‍රන්ථයන්හි ඉතා සවිස්තර ව දක්වා තිබේ. හස්තචරණවිධිවලින් වියුක්ත ව සිද්ධ වන මන්ත්‍ර පඨනය අසම්පූර්ණ එකක් බවත් මන්ත්‍ර ගායනයේ පරමානන්දය හා සංතෘප්තිය ඇතිවන්නේ ස්වර අවධාරණයන් සහිත වූ විට බවත් සඳහන් ය. එමෙන් ම පූර්වෝක්ත ලක්ෂණයන්ගෙන් වියුක්ත වූ මන්ත්‍ර ගායනය අත්හළ යුතු බව ද ප්‍රාමාණික මූලාශ්‍රයවල අන්තර්ගත ය. වර්ණෝච්චාරණයේ දී මුඛය අතිදෘඪත්ත්වයෙන් මෙන් ම අතිශිථිලත්ත්වයෙන් ද නොපැවතිය යුතු බැව් ශික්ෂාශාස්ත්‍රය තුළ  ප්‍රකාශිත ය. එය කොටි දෙනක් සියපැටවුන් රැගෙන යන්නාක් වැනි අවධානයකින් යුක්ත විය යුතු ය. වේද පුරුෂයාගේ ප්‍රධාන අඞ්ගප්‍රත්‍යඞ්ග ෂඩ් වේදාංගයන්ගෙන් නිරූපිත ය. ඔහුගේ නාසය වන්නේ ශික්ෂාංගය යි. එයින් ම මෙම ශාස්ත්‍රයේ ප්‍රමුඛතාව අවධාරිත ය. මන්ත්‍ර පඨනය සඳහා මේ තරම් ම සුවිශේෂී අවධානයක් ලබා දී ඇත්තේ මන්දැයි විමසිය යුත්තකි. පාණිනී ශික්ෂාවට අනුව ''අනුචිත අක්ෂරොච්චාරණය ආයුෂ පිරිහෙළයි, වරදවා ස්වරණ යෙදීම රෝගපීඩා ඇති කරයි, අශුද්ධොච්චාරණය සහිත මන්ත්‍ර පඨනය වජ්‍රයක්, ආයුධයක් පරිද්දෙන් සිය හිස මත වැටේ'' සාඞ්ගපරිමිත වර්ණෝච්චාරණය නිසා යමෙක් ඍග්, යජුස්, සාමයන්ගෙන් පවිත්‍ර ව බ්‍රහ්ම ලෝකයේ සුපූජිත වන්නේ යන පිළිගැනීම් නිසා වෛදික මන්ත්‍රෝච්චාරණයේදී ස්වර ශාස්ත්‍රයට ලැබී තිබූ ස්ථානය ප්‍රකට වේ. මීට ශික්ෂා ග්‍රන්ථ රාශියක් ම රචනා වී තිබීමෙන් හා එය වෙන ම සාහිත්‍යාඞ්ගයක් ලෙස සංවර්ධනය වීමෙන් තත් කාරණයේ බරපතල බව වඩාත් තීව්‍ර වේ. වේදයේ සුරක්ෂණය, චිරස්ථිතිය හා ඉන් අපේක්ෂිත ඵලාගමය, කාර්ය සාධනය උදෙසා ශුද්ධමන්ත්‍රොච්චාරණ සිද්ධිය කවරාකාරයෙන් හේතුවන්නේද? එක් වර්ණමාත්‍රයක් ගැන පවා මේ නයින් අවධානය යොමුකොට ඇත්තේ කවර වැදගත් හේතුවක් නිසා ද?  යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ මුඛ්‍යාපේක්ෂාව යි. මෙකී ශික්ෂණ ක්‍රම ගිලිහී ඇති වර්තමානයේ හින්දු ලබ්ධිකයන්ට ලෞකික ජීවිතයේ නිරාබාධ, සුඛනම්‍ය ප්‍රවෘත්තියත් පාරලෞකික සදාතනික විමුක්තියත් සාක්ෂාත් කරගැනීම පිණිස වඩාත් අර්ථපූර්ණ ව මෙකී ක්‍රම යොදා ගැනීමට අවශ්‍ය කෙරෙන මඟ පෙන්වීමත් මෙහි අභිප්‍රේතාර්ථය යි.

**ප්‍රමුඛපද** - ශික්ෂා වේදංගය, ස්වරවිද්‍යාව, හස්තචාලානුවිධි, මන්ත්‍ර ගායනය, පාණිනී ශික්ෂා